# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා පරිගණක සංගමය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා පරිගණක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මහතා විසින්
2012 මාර්තු මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 මාර්තු මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[165 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 006694—750(2012/03)

# ශ්‍රී ලංකා පරිගණක සංගමය
# (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා පරිගණක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව.**

"ශ්‍රී ලංකා පරිගණක සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සංගමයක් එම සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද එකී පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබ සහ ඉටුකරනු ලැබ ඇති හෙයින් ද, එම සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මෙම පනත 2012 අංක    දරන ශ්‍රී ලංකා පරිගණක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ශ්‍රී ලංකා පරිගණක සංගමය සංස්ථාගත කිරීම.**

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව ශ්‍රී ලංකා පරිගණක සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ශ්‍රී ලංකා පරිගණක සංගමය, යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීම සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

2—PL 006596—75 (2012/02)

(අ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ යෙදී සිටින වෘත්තිකයන් සඳහා සංවිධානයක් සැපයීම, එහි වෘත්තීයමය කටයුතු අධීක්ෂණය සහ නියාමනය කිරීම මෙන් ම කර්මාන්තයෙහි ඉහළ වෘත්තීය ප්‍රමිති නගාසිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ආ) පනතේ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ප්‍රකාරව සංස්ථාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට වෙනත් සාමාජිකත්ව ප්‍රභේද අතර වරලත් සාමාජිකත්ව තත්ත්වය පිළිගැනීම, පැවරීම, සහ ප්‍රදානය කිරීම ;

(ඇ) තොරතුරු සහ සන්නිවේදනය අධ්‍යයනය සහ ක්‍රියාවේ යෙදවීම ප්‍රවර්ධනය  සහ සංවර්ධනය කිරීම මෙන්ම මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා දැනුම ලබාදීම, අධ්‍යාපනය පුහුණුව සහ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම සහ ඒ හා සම්බන්ධ තාක්ෂණික දැනුම අත්කර ගැනීම සහ අන්තර් හුවමාරුකර ගැනීම ;

(ඈ) සංස්ථාවේ වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සහ ශ්‍රී ලංකාවෙන් පිටත ආර්ථික සහ මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම, සංවිධානය කිරීම සහ ඒවායේ නියැලීම මෙන්ම එවැනි කටයුතු පවත්වා ගෙන යාම ;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමට විභාග පැවැත්වීම සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ යෙදී සිටින තැනැත්තන්ගේ හැකියාව පරීක්ෂා කිරීම මෙන්ම සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(ඊ) ස්වකීය වෘත්තීය හැකියා සීමාව තුළින් රටෙහි ආර්ථික සංවර්ධනයට දායකත්වය සැපයීම ;

(උ) සංස්ථාවේ විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති කළමනාකරණය  කිරීම ;

(ඌ) සංස්ථාව විසින් පවත්වාගෙන යෑමට හෝ යෙදී සිටීමට අපේක්ෂා කරනු ලබන යම් ව්‍යාපාරයක් හෝ ගනුදෙනුවක් පවත්වාගෙන යන හෝ එවැනි ක්‍රියාවක යෙදී සිටින යම් තැනැත්තකු සමග එකඟව ක්‍රියාකිරීම

සඳහා සහයෝගීව, අන්‍යෝන්‍ය එකඟත්වය ඇතිව හෝ වෙනත් ආකාරයකින් ක්‍රියා කිරීම සඳහා වැඩ පිළිවෙලවල්වලට ඇතුළත්වීම ; සහ

(ළ) සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි සමාන වෘත්තීයමය ආයතන සමග සම්බන්ධීකරණය වීම.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, සංගමය විසින් ජනවර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය නොසලකා ක්‍රියාකරන බවට සහතික විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් ව, තෝරාපත් කරන ලද හෝ පත් කරන ලද සභාපති, උපසභාපති, ලේකම් සහ වෙනත් නිලධරයන්ගෙන් සමන්විත වන (මෙම පනතේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක සභාවක් විසින් 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත් ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රථම විධායක සභාව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන සංගමයේ විධායක සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා, හෝ දේ කිරීමට, ඉටුකිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍යවන යම් නිශ්චල දේපල අත්කරගැනීම, දැරීම, කුලියට හෝ බද්දට ගැනීම හෝ ලබාදීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම, හෝ අන්‍යාකාරයකින් අන්සතු කිරීම හෝ සම්බාධක කිරීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඍජුවම හෝ සංස්ථාව විසින් තත්කාර්යය සඳහා බලය ලබාදුන් යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් ඇතුළත්වීම සහ එම කොන්ත්‍රාත් හෝ ගිවිසුම් ඉටුකිරීම හෝ පවත්වාගෙන යාම ;

(ඇ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, පරිත්‍යාග සහ රික්තවරණ භාරගැනීම ;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජන කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යෑම ;

(ඉ) සංස්ථාව විසින් පවත්වනු ලබන යම් විභාග සඳහා සහ යම් සාමාජිකත්ව වර්ග සඳහා තැනැත්තන් ඇතුළත් කිරීමේ ගාස්තු වශයෙන් සංස්ථාව විසින් සාධාරණ බවට තීරණය කරනු ලබන යම් ගාස්තු අයකිරීම ;

(ඊ) සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ සංස්ථාව විසින් සුදුසු බවට නිශ්චය කරන යම් ඇප මත සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම ; සහ

(උ) සංස්ථාවේ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, මාරුකිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම ;

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සංස්ථාවේ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකගේ ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් යමක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාව විසින් පවත්වනු ලබන විභාග සඳහා සහ යම් සාමාජිකත්ව ප්‍රභේද සඳහා තැනැත්තන් ඇතුළත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් සාධාරණ බවට තීරණය කරනු ලබන ගාස්තු තල තීරණය කිරීම ;

(ඇ) නිලධාරි මඬුල්ලක් තෝරාගැනීම, නිලධාරි මඬුල්ල ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන්ගේ බලතල කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ සහ සභාවේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම, එම රැස්වීම් පවත්වන කාලය, ස්ථාන, ඒ පිළිබඳ නිවේදන සහ න්‍යාය පත්‍රය එහි ගණපූරණය මෙන් ම ඒවායේ කටයුතු ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය සහ කළමනාකරණය සහ එහි අරමුදල් සන්තකයේ තබාගැනීම ;

(උ) සංස්ථාවේ අරමුණු මනා ලෙස ඉටු කිරීම සඳහා කමිටු පිහිටුවීම ; සහ

(ඌ) සංස්ථාවේ සහ සභාවේ සාමාජිකයන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම්.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, මින්පෙර හෝ මින් මතු සංස්ථාව සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් හෝ යම් මූල්‍ය ආයෝජන වශයෙන් ලැබෙන සියලු මුදල්

සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් සහ විගණනය.**

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් හා සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව විසින් පත් කරනු ලැබිය යුතු සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ “සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**සංස්ථාවේ මුද්‍රාව.**

**9.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සභාපති හෝ උපසභාපති සහ සභාව විසින් යථාපරිදි පත්කළ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති සංගමය විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු දායක මුදල් ප්‍රමාණය, තත්කාලය සඳහා ඒ සාමාජිකයාගේ සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන පරිදි දායක වීමට යටත් නොවන්නේ ය.

මුදල් සහ දේපල අදාළ වීම.

**12.** ඕනෑම ආකාරයකින් උපචිත වන සංස්ථාවේ මුදල් සහ දේපල මෙහි නිශ්චිතව දක්වා ඇති සංස්ථාවේ අරමුණු ඉටු කිරීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, සංස්ථාවේ සාමාජිකයන්ට ඍජුව හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ වෙනත් කිසිම ආකාරයක ගෙවීමක් හෝ පැවරීමක් සඳහා එම මුදල් හෝ දේපලවල කිසිම කොටසක් භාවිත නොකළ යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ, හෝ වෙනත් ආකරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා 6 වන වගන්තිය ප්‍රකාරව සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ සියලු දේපල සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය, බැරකම් හා බාහිර ගෙවීම් පියවීමෙන් පසුව යම් දේපලක් ඉතිරිව ඇත්නම්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදාහරිනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හේ දේපලක් සිය සාමාජිකයන් අතර බෙදාහැරීම තහනම්ව ඇත්තා වූ ද යම් ආයතනයකට හෝ ආයතනවලට, එම දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙර සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.